Follow us on @lankadeepa www.facebook.com /lankadeepa subscribed :lankadeepa online www.lankadeepa.lk

අඛණ්ඩවම 16 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

31 වැනි කාණ්ඩය | 262 වැනි පත්‍රය | පිටු 12 යි | විජය ප්‍රකාශනයක් | 2022 ජූලි මස 15 වැනිදා සිකුරාදා | මිල රුපියල් 50.00 යි

## කොළඹ ප්‍රචණ්ඩ විරෝධතා

## අත්‍යවශ්‍ය දේකට හැර ශ්‍රී ලංකාවට යන්න එපා

බ්‍රිතාන්‍යය-ඕස්ට්‍රේලියාව-සිංගප්පූරුව බහරේනය එම රටවැසියන්ට කියයි

5 පිටුව බලන්න



# ගෝඨාභය ඉල්ලා අස්වෙයි

## ලියුම කතානායකට

■ සුජිත් හේවාජුලිගේ

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති තනතුරින් ඉල්ලා අස්වීමේ ලිපිය කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට ඊයේ (14) රාත්‍රියේ බාරදී ඇත. සිංගප්පූරුවේ සිටින රාජපක්ෂ මහතා මෙම ඉල්ලා අස්වීමේ ලිපිය බාරදී ඇත්තේ ශ්‍රී ලංකාවේ සිංගප්පූරු තානාපති කාර්යාලය මාර්ගයෙනි.

නීතිමය කටයුතු අවසන් කිරීමෙන් පසු ඒ සම්බන්ධ නිල නිවේදනය කතානායකයා විසින් අද (15) ප්‍රකාශයට පත්කෙරෙන බව කතානායක කාර්යාලය පවසයි.

6 වැනි පිටුවට

## වැඩබලන ජනපති



# රනිල් අද දිවුරුම් දෙයි

■ අංජුල මහික වීරරත්න

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වැඩබලන ජනාධිපති ලෙස අද (14) පෙරවරුවේ දිවුරුම් දීමට නියමිතය.

6 වැනි පිටුවට

## පොල්දූව හන්දියේ ගැටුම: සෙබළු දෙකකට පහරදී ගිනි අවි පැහැරගෙන

### හමුදාවේ-පොලිසියේ 21 ක් වැසියෝ 40 ක් රෝහලේ

■ ඉන්දිකා රාමනායක සහ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

බත්තරමුල්ල, පොල්දූව මංසන්දියේ පෙරේදා (13) ඇති වූ නොසන්සුන්තාව අතරතුර යුද හමුදා සාමාජිකයක් දෙදෙනකු ළඟ තිබූ ගිනි අවි දෙකක් හා උණ්ඩ 60ක් අඩංගු මැගසින් දෙකක් පැහැරගෙන ගොස් ඇති බව හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා පවසයි.

6 වැනි පිටුවට

## අරගලකරුවෝ ඇල්លූ මන්දිර බාරදෙති

■ ඩයනා උදයංගනී

තමන් අත්පත් කරගත් රජයේ ගොඩනැගිලිවලින් ඉවත්වීමට ගාලු මුවදොර අරගලකරුවෝ ඊයේ (14) තීරණය කළහ.

එහි පළමු පියවර ලෙස ඔවුහු ජනාධිපති මන්දිරයෙන් ඊයේ දහවල් ඉවත්වූහ.

6 වැනි පිටුවට



ගාලු මුවදෙර අරගලකරුවන් අත්පත් කරගෙන සිටි ජනාධිපති මන්දිරය, අරලියගහ මන්දිරය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය යන ගොඩනැගිලිවලින් ඉවත්වීමට එම අරගලකරුවන් තීරණය කළ අතර එහි පළමු පියවර ලෙස ජනාධිපති මන්දිරය ඊයේ (14) යළි බාරදෙනු ලැබීය. අරගලකරුවන් ජනාධිපති මන්දිරයෙන් පිටවූ අවස්ථාවේදී එහි ආරක්ෂාවට යොදවා සිටි විශේෂ කාර්ය බළකා නිලධාරීන්ගෙන් සමුගත් අයුරු.

(ඡායාරූපය - ළහිරු හර්ෂණ)



## කතානායක මාස 3 කට ජනපති වී අන්තර්කාලීන පාලනයක් ඇතිකළ යුතුයි

■ මුදිතා දයානන්ද

රටේ නායකයා වගකීම පැහැර හැර රටෙන් පලාගිය අවස්ථාවක ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයකු පත්කර ගැනීමේ බලය පාර්ලිමේන්තුවට ඇති බවද අද (15) රැස්වන පාර්ලිමේන්තුවේ පළමු කාර්යභාරය විය යුත්තේ එය බවද ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා ඊයේ (14) පැවැසීය.

6 වැනි පිටුවට

## මහජන දේපොළට අත නොතබනු

### බලතල පැවරුණු යුදහමුදාව අනතුරු අඟවයි

■ ඉන්දිකා රාමනායක

මහජන දේපළ මෙන්ම සියලු මර්මස්ථාන සහ මහජන ජීවිත සුරැකීමේ වගකීම හමුදාව වෙත පැවරී ඇති බවත් එම බලය පාවිච්චි කිරීමට හමුදාව කිසිසේත්ම මැලි නොවන බවත් යුද හමුදාව නිවේදනයක් නිකුත් කරමින් දන්වා සිටියි.

6 පිටුවට



## මැතිසබේ බහුතරය කැමති නම් ජනපතිකම බාරගන්න සූදානම්

5 පිටුව බලන්න

## නව අගමැතිකමට විපක්ෂ අපේක්ෂක නම අද කතානායකට

5 පිටුව බලන්න

## කොළඹ දිසාවට පැනවූ ඇඳිරිය අද උදේ 5 ට ඉවරයි

පණ්කජ රුවින්දගේ

### සරදම්



මොකක්ද සෑර් දැන් හිතෙන්නේ?

ජී.අයි බටවලින් රටක් පාලනය කරන්න බෑ කියලා !

## දිඹුලාගල සියක් නමකගේ දන්වේලටත් තෙල් හිඟය හරස් වෙලා

6 පිටුව බලන්න

## පාර්ලිමේන්තුව වහා කැඳවා විධිමත් පාලනයක් ඇතිකළ යුතුයි

### මහ නාහිමිවරු කියති

6 පිටුව බලන්න

## ඉල්ලා අස්වී සර්වපාක්ෂික රජයක් හැදීමට කතානායකට රට බාරදෙන්න

### ස්වාධීන පක්ෂ එකමුතුව අගමැතිගෙන් ඉල්ලයි

5 පිටුව බලන්න




1 වැනි පිටුවෙන්...

# කොළඹ පුරා ප්‍රචණ්ඩ විරෝධතා: අත්‍යවශ්‍ය දේකට හැර ශ්‍රී ලංකාවට යන්න එපා

## බ්‍රිතාන්‍යයට-ඔස්ට්‍රේලියාව-සිංගප්පූරුව බහරේනය එම රටවැසියන්ට කියයි

■ විමුක්ති එස්. රුද්‍රිගු

**අත්‍යවශ්‍ය කරුණකට හැර ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමෙන් වළකින ලෙස එක්සත් රාජධානිය, සිංගප්පුරුව සහ බහරේනය එම රටවල සංචාරක උපදේශන යාවත්කාලීන කරමින් තම පුරවැසියන්ට උපදෙස් දී ඇත.**

ඕස්ට්‍රේලියාවද සිය සංචාරක උපදේශනය යාවත්කාලීන කරමින් කොළඹ පුරා ප්‍රචණ්ඩ විරෝධතා පැවැත්වෙන බැවින් ආරක්ෂක හේතූන් මත ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට පෙර දෙවරක් සිතා බලන ලෙස එරට පුරවැසියන්ට උපදෙස් දී තිබේ.

ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ කාර්ය මණ්ඩලවලට අයත් පවුල්වල සාමාජිකයන්ට ස්ව කැමැත්තෙන් පිටවීම හෝ රැඳී සිටීමට ඕස්ට්‍රේලියානු රජය අවසර දී ඇතැයි යාවත්කාලීන කළ සංචාරක උපදේශනයේ දැක්වේ.

ශ්‍රී ලංකාවේ හදිසි නීතිය ප්‍රකාශයට පත්කර ඇති බවත් දිවයින පුරා ඇඳිරි නීතිය පනවා ඇති බවත් බ්‍රිතාන්‍ය යාවත්කාලීන කරන ලද සංචාරක උපදේශනයේ දැක්වේ. ශ්‍රී ලංකාවේ සිටින තම පුරවැසියන්ට ශ්‍රී ලංකාව තුළ සංචාරය කිරීමෙන් වැළකී තමන් සිටින හෝටලයේ හෝ නේවාසිකාගාරයේ රැඳී සිටින ලෙසද බ්‍රිතාන්‍ය රජය උපදෙස් දී ඇත.

ශ්‍රී ලංකාවේ ඉන්ධන, ඖෂධ, ආහාර සහ ගෑස් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයක් තිබෙන බවත්, කොළඹ පුරා ප්‍රචණ්ඩ විරෝධතා පැවැත්වෙන බවත් ශ්‍රී ලංකාව දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින බවත් එම සංචාරක උපදේශනවල දැක්වේ.

# වහා ඉල්ලා අස්වී සර්වපාක්ෂික රජයක් හැදීමට කතානායකට රට බාරදෙන්න

## ස්වාධීන පක්ෂ එකමුතුව අගමැතිගෙන් ඉල්ලයි

**වහාම ධුරයෙන් ඉල්ලා අස්වී සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීම සඳහා කතානායකවරයාට රට බාර දෙන මෙන් අගමැතිවරයාගෙන් ඉල්ලා සිටින බව ස්වාධීන පක්ෂ එකමුතුව නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.**

ආර්ථික අර්බුදය මානව ආපදාවක් බවට පත් කිරීමෙන් විදේශ හමුදාවන්ට මෙරටට පැමිණීමට දෙරටු විවෘත විය හැකි බැවින් ලංකාව දකුණු ආසියාවේ ලිබියාව බවට පත් නොකිරීමට අත්වැල් බැඳ ගන්නා මෙන් සමස්ත ජාතියට ආයාචනා කරන බව ද එම එකමුතුව සඳහන් කරයි.

විජය ධරණී මහා සභාවේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි, ජාතික නිදහස් පෙරමුණේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර, පිවිතුරු හෙළ උරුමයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල, ලංකා සමසමාජ පක්ෂයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී මහචාර්ය තිස්ස විතාරණ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජී. වීරසිංහ, මහජන කොංග්‍රසයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා, ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න, යුතුකම ජාතික සංවිධානයේ කැඳවුම්කරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග, සත්‍ය ගවේෂකයෝ කැඳවුම්කරු, පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත යන ස්වාධීන පක්ෂ එකමුතුවේ නායකයන්ගේ අත්සනින් නිකුත් කර ඇති නිවේදනයේ මෙසේ ද සඳහන්වේ.

2022 ජූලි 09 දින කතානායකතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වූ පක්ෂ නායකයින් ඒකමතිකව ඉල්ලා සිටි පරිදි අගමැතිතුමා ඉවත් වීමට කටයුතු නොකිරීමෙන් රට තුළ ව්‍යාකූල තත්වයක් පැන නැගී ඇති බවත් එකී තත්වය ප්‍රචණ්ඩත්වයක් කරා වර්ධනය වෙමින් පවතින බවත් අපි නිරීක්ෂණය කරමු. එහි ප්‍රතිඵලයක් ලෙස අරගලකරුවන් විසින් අගමැති කාර්යාලය අත්පත් කරගෙන ඇත. එබැවින් අගමැතිවරයා වහාම සිය ධුරයෙන් ඉල්ලා අස්වී සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීම සඳහා කතානායකතුමාට රට භාර දෙන මෙන් අපි ඉල්ලා සිටිමු.

ඇතැම් පිරිස් අද සවස් භාගයේ සිට පාර්ලිමේන්තුව වට කිරීමට ද උත්සාහ කරන බව දැනගන්නට ඇත. ඒ කුමන අරමුණක් ඉටුකර ගැනීමට දැයි අප්‍රකාශිතය. පාර්ලිමේන්තුව යනු ජනතා පරමාධිපත්‍යයේ ද ප්‍රජාතන්ත්‍රවාදයේ ද මුදුන් මල්කඩයි. පාර්ලිමේන්තුවේ පැවැත්මට එල්ල කරන තර්ජනය ජනතා පරමාධිපත්‍යයට ද ප්‍රජාතන්ත්‍රවාදයට ද එල්ල කරන මරු පහරක් ලෙස අපි දකිමු. පාර්ලිමේන්තුවේ කටයුතුවලට බාධා කිරීම යනු ජූලි 20 දින පැවැත්වීමට නියමිත නව ජනාධිපතිවරයකු තෝරා ගැනීමට ද ඒ හරහා රට යළි සාමකාමී කිරීමට ද එල්ල කරන බාධාවකි. එමෙන්ම පවතින ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමේ දී ද ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම තීරණාත්මක සාධකයකි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය ද පාර්ලිමේන්තුව ප්‍රමුඛ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ද රැක ගැනීම ආණ්ඩුවේ ද ආරක්ෂක හමුදාවන්ගේ ද සියලුම දේශපාලන පක්ෂවල ද බහුජන සංවිධාන හා අරගලකරුවන්ගේ ද පරම යුතුකම බව අපි තරයේ අවධාරණය කරමු.

අරාජිකත්වය සහ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව මානව ආපදාවක් කරා ශීඝ්‍රයෙන් ගමන් කරමින් පවතියි. ආර්ථික අර්බුදය මානව ආපදාවක් බවට පත් කිරීමෙන් විදේශ හමුදාවන්ට මෙරටට පැමිණීමට දෙරටු විවෘත විය හැක. එබැවින් ලංකාව දකුණු ආසියාවේ ලිබියාව බවට පත් නොකිරීමට අත්වැල් බැඳ ගන්නා මෙන් අපි සමස්ත ජාතියට ආයාචනය කරමු.



## පාර්ලිමේන්තුවේ ආරක්ෂාවට හමුදාව කැඳවයි

**පාර්ලිමේන්තුවට පිවිසෙන පොල්දූව මංසන්ධියේදී පැවැති විරෝධතාවක් හේතුවෙන් පෙරේදා (13) ඇතිවූ උණුසුම් තත්ත්වයෙන් පසුව පාර්ලිමේන්තුවේ ආරක්ෂාව තර කර තිබූ අතර එම පිවිසුම් මාර්ගයේ මාර්ග බාධක යොදවා සහ ඒ අසලට යුද හමුදාව කැඳවා තිබූ අයුරු ඡායාරූපයේ දැක්වේ.**

(ඡායාරූපය - හිමත් මතීෂ)

# මැතිසබේ බහුතරය කැමතිනම් ජනපතිකම බාරගන්න සූදානම්

## සරත් ෆොන්සේකා කියයි

■ නිමල කොඩිතුවක්කු

**සමගි ජනබලවේගයේ එකඟතාව ඇතිව පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකින් ආරාධනා ලැබුණහොත් ජනාධිපතිධුරය බාරගැනීමට තමන් සූදානම් බව සමගි ජන බලවේගයේ සභාපති ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා කොළඹදී ඊයේ (14) පැවසීය.**

අගමැති ධුරය බාරගන්නා ලෙසටද පොහොට්ටුව පාර්ශ්වයෙන් තමන්ට දිගින් දිගටම ආරාධනා ලැබෙමින් තිබෙන බව ෆොන්සේකා මහතා සඳහන් කළේය.

රට බලාපොරොත්තු වන ප්‍රගතිශීලී දේශපාලන වැඩපිළිවෙළක් සඳහා තමන්ට සහයෝගය ලබාදීමට පොහොට්ටුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු පිරිස් දිනපතා තමන්ට කතා කරන බවද ඔහු සඳහන් කළේය.

රාජපක්ෂවරුන් රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු කණ්ඩායමේ දූෂිත දේශපාලනය නිමා කළත් ඊළඟට පත්වන්නේ ද දූෂිත දේශපාලනඥයන් බැවින් ජනතාව අපේක්ෂා කරන පාලනය ඉන් බිහි නොවන බවද ෆොන්සේකා මහතා කොළඹදී පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

යුද්ධයට නායකත්වය දීමේ දී ද තමන්ට නොයෙකුත් අභියෝග එල්ල වූ බවත් රට වෙනුවෙන් අභියෝග බාරගැනීමට තමන් පසුබට නොවන බවත් ෆොන්සේකා මහතා සඳහන් කළේය.

ලැබෙන ආරාධනා සම්බන්ධයෙන් සමගි ජන බලවේගය නායක සජිත් ප්‍රේමදාස මහතා ප්‍රමුඛ පක්ෂය දැනුවත් කළේද යන්න සම්බන්ධයෙන් මාධ්‍ය කළ විමසීමකදී ඔහු සඳහන් කළේ තමන්ගේ පෞද්ගලික දේශපාලන සාකච්ඡා සියල්ලම ගැන පක්ෂ නායකත්වය දැනුවත් කිරීම අනවශ්‍ය බවයි.

තමන්ට රට වෙනුවෙන් වගකීම් බාර දෙන්නේ නම් අරගලකරුවන්ගේ අරමුණ ජයග්‍රහණය කර රට ජයග්‍රහණය කිරීමට කටයුතු කරන බවද ෆොන්සේකා මහතා එහිදී කීවේය.

ජනාධිපති මන්දිරය අරලියගහ මන්දිරය බාරදීමට හදිසි නොවන ලෙස අරගලකරුවන්ගෙන් ඉල්ලීමක් කළ හෙතෙම දේශපාලඥයන් තීන්දු ගැනීමෙන් පසු හරි වෙලාවට ඒවා බාරදිය හැකි බව කීවේය.

එමෙන්ම දූෂිත දේශපාලනඥයන් සහ මන්දිර ආරක්ෂා කරනවා වෙනුවට රටේ ජනතාව ආරක්ෂා කිරීමට කැප වන්නැයි ආරක්ෂක අංශ වලින් තමන් පෞද්ගලිකව ම ඉල්ලා සිටින බවද ඔහු කීවේය.

# නව අගමැතිකමට විපක්ෂ අපේක්ෂක නම අද කතානායකට

■ නිමල කොඩිතුවක්කු

**නව අග්‍රාමාත්‍යධුරය සඳහා විපක්ෂයේ පක්ෂ යෝජනා කරන නම අද (15) පැවැත්වෙන පක්ෂ නායක රැස්වීමේදී කතානායකවරයා වෙත ඉදිරිපත් කරන බව සමගි ජනබලවේගයේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා ප්‍රකාශ කළේය.**

විපක්ෂයේ දේශපාලන පක්ෂ සමඟ මේ සම්බන්ධයෙන් (14) ඊයේ දිනයේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බවත් ඒ අනුව එම නම අද දින යෝජනා කරන බවත් මහ ලේකම්වරයා සඳහන් කළේ ය.

ජනතා විමුක්ති පෙරමුණ හැර විපක්ෂය නියෝජනය කරන සියලුම පක්ෂ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන පිරිසක් මේ සඳහා සහයෝගය පළ කළ බවද මහලේකම්වරයා පැවසීය.

සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමට ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය යන දෙපාර්ශ්වයම පිළිගන්නා අග්‍රාමාත්‍යවරයකු නම් කරන බව ඔහු කීවේය.

# ගෝඨාභය-රනිල් ඉල්ලා අස්වනතුරු වර්ජන-හර්තාල්

## සමිති එකමුතුව කියයි

ඡඩයනා උදයංගනී

**ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ යන මහත්වරුන් ඉල්ලා අස්වන තෙක් අඛණ්ඩ වැඩ වර්ජන සහ හර්තාල් ව්‍යාපාර ඇතුළු වෘත්තීය ක්‍රියාමාර්ග ආරම්භ කරන බව වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකමුතුව පවසයි.**

ඉදිරි දින කිහිපයේදී රට පුරා ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශ වැඩබිම් තුළ මෙම වෘත්තීය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව ලංකා බැංකු සේවක සංගමයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති අනූප නන්දුල මහතා පැවසීය.

ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති රනිල් වික්‍රමසිංහ යන මහත්වරුන් ඉල්ලා අස්විය යුතු බවට ජනතාව අඛණ්ඩව කරමින් සිටින ඉල්ලීමට කන්දීමට ඔවුන් සූදානම් නැතිනම් වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව ද ඔහු සඳහන් කළේය.

දැනටත් ඔවුන් දෙදෙනා මහජනයා අතර දැඩි අප්‍රසාදයට ලක්ව සිටින බැවින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග දක්වා එය දිග්ගැස්සෙන්නට නොදෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලීමක් කරන බව ද නන්දුල මහතා කීවේය.

ඔහු මේ බව පැවසුවේ වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකමුතුව මගින් කොළඹ දී පැවැත්වූ මාධ්‍ය හමුවක් අමතමිනි.

මීට පෙර අප්‍රේල් 28 හා මැයි 6 දිනවල ක්‍රියාත්මක කළ හර්තාල්, වැඩවර්ජන, උද්ඝෝෂණවලට වඩා ඉදිරියට ගිය වෘත්තීය ක්‍රියාමාර්ග මෙවර ගන්නා බව ද හෙතෙම සඳහන් කළේය.

එමෙන්ම තමන් ඉල්ලන්නේ අන්තර්වාර පාලනයක් මිස සර්වපාක්ෂික ආණ්ඩුවක් නොවන බව ද ඔවුහු පැවසූහ.

වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකමුතුව නියෝජනය කරමින් ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝශප් ස්ටාර්ලින්, තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය නියෝජනය කරමින් තරිඳු උඩුවරගෙදර, කම්කරු අරගල මධ්‍යස්ථානය නියෝජනය කරමින් සංජීව බණ්ඩාර යන මහත්වරු ද මෙහිදී අදහස් දැක්වූහ.

# පැය 72න් විසඳුමක් නොදුන්නොත් 18දාට වෘත්තීය සමිති අරගල බිමේ

## වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

■ යොහාන් භාසුර

**රට පත්ව ඇති ව්‍යාකූල තත්ත්වයට කතානායකවරයා ඇතුළු බලධාරීන් පැය 72ක් තුළ ව්‍යවස්ථානුකූල විසඳුමක් ලබාදිය යුතු බවත් එසේ නොවුණහොත් ලබන 18 වැනිදා වනවිට සමස්ත වෘත්තීය සමිති ව්‍යාපාරයම අරගල බිමට කැඳවන බවත් වෘත්තීය සමිති සම්බන්ධීකරණය මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරු රවී කුමුදේෂ් මහතා ඊයේ පැවසීය.**

ව්‍යවස්ථාවෙන් ඔබ්බට ගිය කැළෑ නීතියක් වෙනුවෙන් වෘත්තීය සමිති කිසිසේත්ම පෙනී නොසිටින බව කී රවී කුමුදේශ් මහතා වෘත්තීය සමිති ව්‍යාපාරය ලබන 17 වැනිදා යෝජනාවලියක් ඉදිරිපත් කිරීමටද බලාපොරොත්තු වන බවද සඳහන් කළේය.

වෘත්තීය සමිති ව්‍යාපාරයද නියෝජනය කරන අරගල බිමෙන් ඉදිරිපත් කළ ව්‍යවස්ථානුකූල යෝජනා පිළිබඳවත් සැලකිල්ල යොමු කිරීමට බලාපොරොත්තු වන බවත් ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා ඉවත්වීම සෑම අරගල භූමියකම පොදු ඉල්ලීම බවත් කුමුදේෂ් මහතා වැඩිදුරටත් කීය.

# කොළඹ දිසාවට පැනවූ ඇඳිරිය අද උදේ 5 ට ඉවරයි

■ ඉන්දිකා රාමනායක

**කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයට ඊයේ (14) දහවල් 12.00සිට අද (15) අලුයම 5.00 දක්වා ඇඳිරි නීතිය පනවනු ලැබීය.**

වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු මෙසේ ඇඳිරි නීතිය පනවමින් විශේෂ ගැසට් නිවේදනයක් ඊයේ නිකුත් කළේය.

# පේරාදෙණිය ළමා රෝහලේ වෛද්‍යවරයෙක් 'එක්මෝ' ප්‍රතිකාර ගනිද්දී මියයයි

## යතුරුපැදියට බටයක් දමා කටින් පෙට්‍රල් ඇදලා

■ ගාල්ල සිරංගිකා ලොකුකරවිට

**පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ වෛද්‍යවරයකු කරාපිටිය ශික්ෂණ රෝහලේ එක්මෝ ප්‍රතිකාර ලබමින් සිටිය දී මියගොස් ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි. මෙලෙස මියගොස් ඇත්තේ හාලිඇළ පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ චින්තක දීපාල් අමරසූරිය නමැති 30 හැවිරිදි වියේ පසු වූ වෛද්‍යවරයෙකි.**

නිව්මෝනියා තත්ත්වයක් සමඟ රුධිරයට විෂබීජයක් යාමෙන් ඇති වූ කම්පන තත්වයෙන් ඔහු මියගොස් ඇති බව පශ්චාත් මරණ පරීක්ෂණයේ දී සඳහන් විය. මෙම මරණය සම්බන්ධ හදිසි මරණ පරීක්ෂණය ඊයේ (14) ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ දී අතිරේක නාගරික හදිසි මරණ පරීක්ෂක චන්ද්‍රසේන ලොකුගේ මහතා විසින් පවත්වන ලදී.

මියගිය වෛද්‍යවරයා එක්දරු පියෙකි. ඔහු කොරෝනා ආසාදිතව ප්‍රතිකාර ලබා ඇති අතර සති කිහිපයකට පෙර ඉන්ෆ්ලුවන්සා රෝගය ද වැළඳී සිටි බව මරණ පරීක්ෂණයේදී අනාවරණය වී තිබිණි. දින කිහිපයක් පෙට්‍රල් පෝලිම්වල ද රැඳී සිට ඇති වෛද්‍යවරයා තම කාරයේ තිබූ පෙට්‍රල් යතුරුපැදියට ගැනීම සඳහා බටයක් යොදා කටින් පෙට්‍රල් ඇද ඇති බව ද ඥාතීන් පවසා ඇත.

ඉන් පසුව රෝගීව නිව්මෝනියා තත්වයට පත්වූ ඔහු පේරාදෙණිය රෝහලට ඇතුලත්කර ඇත. පසුව මහනුවර රෝහලට ඇතුළත් කර ඇති අතර එක්මෝ ප්‍රතිකාර සඳහා පසුගිය 11 වැනි ද කරාපිටිය රෝහලට මාරුකර එවා තිබිණි. ඊයේ (14) උදෑසන ඔහු මියගියේය.

මියගිය වෛද්‍යවරයාගේ සිරුර සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණය විශේෂඥ අධිකරණ වෛද්‍ය ජානකී වරුසාහැන්නදි මහත්මිය විසින් පවත්වන ලදී.



# මැදපෙරදිග සංචාරය අරඹමින් ජෝ බයිඩන් ඊශ්‍රායලයේ

■ වොෂින්ටනයේදීය (ඒ.එෆ්.පී.)

**මැදපෙරදිග සංචාරය ආරම්භ කරමින්, ඇමෙරිකා ජනාධිපති ජෝ බයිඩන් ඊයේ (14) ඊශ්‍රායලයට පැමිණියේය. ඇමෙරිකන් ජනාධිපතිවරයා උණුසුම් ලෙස පිළිගනු ලැබුවේ ඊශ්‍රායලයේ අන්තර්වාර අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කරන යාර් ලුපිද් විසිනි.**

ඊශ්‍රායලය දේශපාලන අර්බුදයක පැටැලී සිටින අතර, කිසිදු පක්ෂයකට පාර්ලිමේන්තුවේ බහුතරයක් නොමැත. මෙම වසර අවසානයේ ඊශ්‍රායලයේ යළි මහ මැතිවරණයක් පැවැත්වෙන අතර එතෙක්, අග්‍රාමාත්‍ය ධුරය හොබවන්නේ යාර් ලුපිද් ය.

ඊශ්‍රායල අන්තර්වාර අග්‍රාමාත්‍ය ලුපිද් පමණක් නොව, බටහිර ඉවුරේ පලස්තීන නායකයන් හමුවීමට ද බයිඩන් සූදානමින් සිටී. ඩිමොක්‍රටික් ජනාධිපති බැරක් ඔබාමා ධුරය හොබවද්දී, ඔබාමාගේ දෙවැනියා, එසේත් නැතිනම් ඇමෙරිකා උප ජනාධිපතිවරයා වූයේ බයිඩන්ය. ඔබාමා පාලන සමයේ ඔබාමා මැදිහත් වී ඊශ්‍රායල පලස්තීන මැදපෙරදිග අවුලට විසඳුම් ලබා දීමට උත්සාහ ගත්තේය.

කෙසේ නමුත් ඔබාමාගෙන් පසු බලයට ආ රිපබ්ලිකන් අපේක්ෂක ඩොනල්ඩ් ට්‍රම්ප් පලස්තීනුවන් අමතක කර සෘජුව සහාය දැක්වූයේ ඊශ්‍රායලයටය. එවකට ඊශ්‍රායලයේ අග්‍රාමාත්‍ය ධුරය හෙබවූයේ බෙන්ජමින් නෙදන්යාහුය. පලස්තීනුවන් ද අයිතිය ඉල්ලන ජෙරුසලම, ඊශ්‍රායලයේ අගනුවර ලෙස නිල වශයෙන් නම් කළේ ද ඩොනල්ඩ් ට්‍රම්ප්ය.

ජෝ බයිඩන් ඇමෙරිකා ජනාධිපති ධුරයට පත් වූයේ 2021 දීය. එදා සිට ඔහු ඊශ්‍රායල පලස්තීන අර්බුදයට මැදිහත් නොවුණු බව පලස්තීනුවන් චෝදනා නගා තිබේ. බයිඩන් පලස්තීන නායකයන් හමුවීමට සූදානමින් සිටින්නේ එසේ චෝදනා එල්ල වන අවස්ථාවකය.

ඇමෙරිකන් ජනාධිපති ලෙස ජෝ බයිඩන්, මැදපෙරදිග සංචාරයකට පැමිණි පළමු අවස්ථාව මෙයයි. මෙම සංචාරයේ දී බයිඩන් ඊශ්‍රායලයේ පමණක් නොව, සෞදි අරාබියේත් සංචාරය කිරීමට නියමිතය. බයිඩන්ගේ මෙම සෞදි සංචාරය ආන්දෝලනාත්මක එකක් වනු නිසැකය. තමන් සෞදියේ සංචාරයකට යන බව නිවේදනය කළ අවස්ථාවේ පටන් ඇමෙරිකා දේශපාලනයේත්, ජගත් දේශපාලනයේත් වැඩි අවධානයක් ඊට යොමු වී තිබේ.

2018 දී ඇමෙරිකන් තීරු ලිපි රචකයකු වුණු සෞදි ජාතික මාධ්‍යවේදී, ජමාල් කශොග්ජි, තුර්කියේ ඉස්තාන්බුල් නුවර සෞදි කොන්සල් කාර්යාලයේ දී ඝාතනය විය. ඔහුගේ සිරුර අතුරුදන් කිරීමට පවා ඝාතකයෝ සමත් වූහ. කශොග්ජි සෞදියේ සල්මාන් කුමරු දැඩි ලෙස විවේචනය කළ අයෙකි. කශොග්ජිගේ ඝාතනය සිදුවූයේ ඔටුන්න හිමි සල්මාන් කුමරුන්ගේ අනුදැනුම මත බව තුර්කි රජය විසින් තහවුරු කරනු ලැබිණි.

ඒ වනවිට ඇමෙරිකාවේ ජනාධිපති ධුරයේ සිටි රිපබ්ලිකන් පාක්ෂික ඩොනල්ඩ් ට්‍රම්ප් කියා සිටියේ සෞදිය හෝ සෞදියේ ඔටුන්න හිමි සල්මාන් කුමරුන්



ඊශ්‍රායලයට පැමිණි ඇමෙරිකන් ජනාධිපතිවරයා පිළිගැනීමට ඊශ්‍රායල අග්‍රාමාත්‍ය යාර් ලුපිද් (මැද) මෙන්ම එරට ජනාධිපති අයිසෙක් හෙර්සොග් ද පැමිණ සිටියේය.

හෝ අමනාප කර ගැනීම කළ නොහැකි බවය. මෙය එවකට ප්‍රතිවාදීන් වූ ඩිමොක්‍රටික්වරුන්ගේ දැඩි විරෝධයට පවා හේතුවක් විය. සෞදිය දරුණු ලෙස මානව හිමිකම් උල්ලංඝනය කළත්, ඒ ගැන කිසිදු අවධානයක් යොමු කිරීමට ට්‍රම්ප් පරිපාලනය කටයුතු කළේ ද නැත.

2019 වසරේ ජනාධිපති අපේක්ෂකයකු ලෙස තරඟ වදිද්දී බයිඩන් ප්‍රතිඥ දී තිබුණේ කශොග්ජි ඝාතනය සම්බන්ධයෙන් සෞදි අරාබියට වන්දි ගෙවීමට සලස්වන බවය. ඝාතනයට ලක් වෙද්දී සෞදියෙන් පිටුවහල් වී සිටි කශොග්ජි ඇමෙරිකාවේ 'වොෂින්ටන් පොස්ට්' පුවත්පතේ තීරු ලිපි රචකයකු ලෙස කටයුතු කරන්න විය.

# උතුරු කොරියාව සමඟ හිතවත්කම් අවසන්

■ කීව්හිදීය (රොයිටර්)

## යුක්රේන ජනාධිපති කියයි

**උතුරු කොරියාව සමඟ පැවැති සියලු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නැවැත්වීමට තීරණය කළේ යැයි යුක්රේන ජනාධිපති ව්ලොදිමීර් සෙලෙන්ස්කි පවසයි.**

නැගෙනහිර යුක්රේනයේ රුසියන් හිතවාදීන් සහ බෙදුම්වාදීන් බහුලව වෙසෙන ඩොනෙක්ස්ක් සහ ලූහාන්ස්ක් යන පළාත් යුක්රේනයෙන් වෙන් වී වෙනම රාජ්‍යයන් බවට පත් වී සිටී. ඩොනෙක්ස්ක් සහ ලූහාන්ස්ක් පාලනයට රුසියාවේ සහාය නොඅඩුව ලැබේ.

රුසියාවේ සමීපතම මිතුරකු වන උතුරු කොරියාව නිවේදනය කර ඇත්තේ තමන් ඩොනෙක්ස්ක් සහ ලූහාන්ස්ක් වෙනම රාජ්‍යයන් ලෙස පිළිගන්නා බවය.මේ වනවිට ඉරානය ද ඇතුළු රටවල් කීපයක් ඩොනෙක්ස්ක් සහ ලූහාන්ස්ක් වෙනම රාජ්‍යයන් ලෙස පිළිගැනීමට ඉදිරිපත් වී සිටී.

උතුරු කොරියා රජය ගත් තීරණය සම්බන්ධයෙන් තමන් දැඩි විරෝධය පළ කරන බවත්, යුක්රේනය සහ උතුරු කොරියාව අතරේ පැවැති සියලු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඒ අනුව අවසන් වන බවත් යුක්රේන ජනාධිපති සෙලෙන්ස්කි පැහැදිලි කර තිබේ.

## ප්‍රසම්පාදන දැන්වීම
## මොනරාගල ප්‍රාදේශීය සභාව

මොනරාගල ප්‍රාදේශීය සභාව සතු පහත උපලේඛන අංක 01 හි සඳහන් දේපළ 2022 වර්ෂයේ සිට බදු දීම සඳහා මොනරාගල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර 2022.07.14 දින සිට 2022.07.27 දින දක්වා රජයේ වැඩ කරන දිනවල කාර්යාල වේලාව තුළ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී නිකුත් කරනු ලබන අතර, 2022.07.28. දින පෙ.ව. 10.00 දක්වා පමණක් ඉල්ලුම්පත්‍ර භාර ගනු ලැබේ.

02. 2022.07.28 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

03. මේ පිළිබඳව සතියේ වැඩ කරන දිනක කාර්යාල වේලාව තුළදී මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 055 - 2276175 අමතා වැඩි විස්තර දැනගත හැකිය.

04. උප ලේඛන 01 නව බස් නැවතුම්පල කඩ කාමර

| අනු අංකය | කඩ කාමර අංකය | මාසික කුලිය | අවම ලංසුව | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| 01 | 01 | 21,500.00 | 500,000.00 | 10,000.00 | 2,500.00 |
| 02 | 02 | 21,500.00 | 500,000.00 | 10,000.00 | 2,500.00 |
| 03 | 03 | 21,500.00 | 500,000.00 | 10,000.00 | 2,500.00 |
| 04 | 04 | 21,500.00 | 500,000.00 | 10,000.00 | 2,500.00 |

සැයු. මෙම වෙළඳසැල් ටෙන්ඩර් මගින් ලබා ගැනීමේදී ගැනුම් කරුවන් ඉදිරිපත් කරනු ලබන ලංසු අතරින් පිළිගන්නා ලද ලංසුවට හිමි මුදල දින 07 ක් ඇතුළත අනිවාර්යෙන් ගෙවා අවසන් කළ යුතු අතර, ඉන් පසුව ගිවිසුම් ගත වීම සිදු කරනු ලබයි.

දිනය:- 2022.07.12

සභාපති.
ප්‍රාදේශීය සභාව,
මොනරාගල

# රුසියාවට ඉරානයෙන් ප්‍රහාරක ඩ්‍රෝන යානා

■ වොෂින්ටනයේදීය (රොයිටර්)

**ඉරානය එරට තාක්ෂණයෙන් නිපදවූ නියමුවන් රහිත ප්‍රහාරක ඩ්‍රෝන යානා තොගයක් යුක්රේන හමුදා සමඟ සටන් වදින රුසියන් හමුදාවට ලබා දීමට බලාපොරොත්තුවෙන් සිටිනවා යැයි ඇමෙරිකාව චෝදනා කරයි.**

ඇමෙරිකා රජය වෙනුවෙන් මෙසේ චෝදනා කර ඇත්තේ ධවල මන්දිර ජාතික ආරක්ෂක ප්‍රධානී ජේක් සුලිවාන්ය. සුලිවාන් මෙසේ පවසා ඇත්තේ ඇමෙරිකන් බුද්ධි අංශ ලබා දුන් වාර්තා පාදක කර ගනිමිනි.

'යුක්රේන යුද්ධයේ දී රුසියානු හමුද යම් පසුබෑසීමකට ලක් වී ඇති බැවින් ඔවුන්ට තම ඩ්‍රෝන තාක්ෂණය ලබා දීමට ඉරානය තීරණය කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපට බුද්ධි තොරතුරු ලැබී තිබෙනවා' යැයි ජේක් සුලිවාන් මාධ්‍ය හමුවේ පැහැදිලි කර තිබේ.

# 'රුසියාවේ පාලකයා' ලෙස පුටින් නම් කිරීමේ සූදානමක්

■ මොස්කව්හිදීය (රොයිටර්)

**රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින්, 'ජනාධිපති' ලෙස නොව රුසියාවේ 'පාලකයා' ලෙස හැඳින්වීම වඩා උචිත යැයි පාලක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යෝජනා කර තිබේ.**

ජනාධිපති පුටින් නියෝජනය කරන්නේ ද මෙම පාලක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි. පක්ෂයේ නායකත්වය හොබවන්නේ ලියොනිඩ් ස්ලුට්ස්කිය. පාලක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය දක්ෂිණාංශික මෙන්ම අන්ත දක්ෂිණාංශික දේශපාලන කණ්ඩායම් එක් වී පිහිටුවා ගත් පක්ෂයකි.

පාලක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පුටින් හිතවාදීන් විසින් පුටින් රුසියාවේ 'පාලකයා' ලෙස හැඳින්වීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇතැයි ද පැවැසෙයි.


මාසෙකට රු.16,500 ගෙයක්
(පදිංචි වෙලා ගෙවන්න)
හොරණ ඉදිකරන තට්ටු පහේ මහල් නිවාස සංකීර්ණය

නිවස ව.අඩි 600 - සාලය, තනි කාමරය (ව.අඩි 160), කුස්සිය, බැල්කනිය, ටොයිලට් එක සමඟ Car Park එක

ඉදිකරන කාලය තුළ — රු. 20,300/= ඉදිකිරීම් කොටස් 100 කට ගෙවන්න
පදිංචි වෙලා — රු. 16,500/= ගානේ මාස 180 ක් (අවුරුදු 15) ගෙවා ඔප්පුව ලබාගන්න
මූලික ගෙවීම් පසුව ගෙවීම් — නැත

| පදිංචිය | | |
|---|---|---|
| | බිම්මහල | 2023 දෙසැම්බර් |
| | 1 , 2 මහල් | 2024 දෙසැම්බර් |
| | 3, 4 වන මහල් | 2025 දෙසැම්බර් |

නිවාස සාදන ඉඩමට පැමිණ රු.1,000/= ගෙවා සාදන නිවසක් වෙන්කරවා ගන්න.

වැඩි විස්තර සඳහා අනිවාර්යයෙන්ම පැමිණෙන්න
හොරණ ටවුන් එකේ ඉඳන් රත්නපුර/ඉංගිරිය පාරේ කි.මී. 01 ක් එනකොට තියෙන ලංගම ඩිපෝව ලගින් ඇති වවුළුගල පාරට හැරිලා කි.මී. 01 ක් එනකොට හමුවෙන වවුළුගල ඉස්කෝලේ ලගට ඇවිත් කතාකරන්න.

076 - 7236277, 070 - 5724081


## දැන්වීමයි

2023 වර්ෂයේ අයවැය සඳහා සලකා බැලීම පිණිස බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළයුතු සංවර්ධන යෝජනා ඇත්නම් **2022.07.30** දිනට පෙර **"සභාපති, ප්‍රාදේශීය සභාව, මොනරාගල"** යන ලිපිනයට හෝ අපගේ ඊ මේල් ලිපිනයට යොමුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**සභාපති**
**ප්‍රාදේශීය සභාව**
**මොනරාගල**
**055 2276175**
**mon.prasabawa@gmail.com**

## Notice

If there any development proposals to be implemented in the Monaragala Pradeshiya Saba area for consideration in the budget for the year 2023, we kindly request send them to **"Chairman, Pradeshiya Saba, Monaragala"** or to our Email before **2022.07.30**

**Chairman**
**Pradeshiya Saba**
**Monaragala**
**055 2276175**
**mon.prasabawa@gmail.com**

## සීමාසහිත හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය

2022.06.30 දිනට පියවන ලද ඡන්දහිමි නාම ලේඛනය 2022.06.30 දිනට පූර්ණ සාමාජික නාම ලේඛනය ප්‍රදර්ශනය කිරීම.
පහත සඳහන් ස්ථානවලදී ප්‍රදර්ශනය කර ඇත. එහි ඔබගේ නම සහ ලිපිනය ඇතුළත්වී නොමැති නම් හෝ යම් සංශෝධනයක් කළ යුතුනම් ඒ බව,
2022.07.01 දින සිට **2022.07.30** දින දක්වා ප්‍රදර්ශනය කරනු ලැබේ. එදිනට පෙර ප්‍රධාන කාර්යාලයට ලිඛිතව තැපෑලෙන් හෝ අතින් භාරදිය යුතුය. එම දිනෙන් පසුව පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

**සමිතියේ ලේකම්**
**සී.ස. හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අංක 41, කොළඹ පාර, හලාවත.**
**දුරකථන අංකය 032-2222364**

| අනු අංකය | ප්‍රාදේශික අංකය | ප්‍රාදේශිකය | ප්‍රදර්ශනය කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | අංක 01 | හලා/දකුණ, ලේක් පාර | හලා/ රෙදි ප්‍රාදේශිකය |
| | අංක 19 | | |
| 2. | අංක 02 | විලව් කෝප්සිටි වෙළඳ සැල | විලව් කෝප්සිටි වෙළඳ සැල |
| 3. | අංක 06 | මුවර් වීදිය | හලා/ රෙදි ප්‍රාදේශිකය |
| 4. | අංක 07 | අලුත් වත්ත | හලා/ රෙදි ප්‍රාදේශිකය |
| | අංක 18 | වට්ටක්කල්ලිය | |
| 5. | අංක 08 | ඉරණවිල | අඹකදවිල මිනි කෝප්සිටිය |
| | අංක 10 | | |
| 6. | අංක 09 | වැල්ල | වැල්ල මිනි කෝප්සිටිය |
| 7. | අංක 11 | මුන්නේශ්වරම | මුන්නේශ්වරම ග්‍රාමීය බැංකුව |
| 8. | අංක 12 | කන්ජුක්කුලිය | කන්ජුක්කුලිය ප්‍රාදේශිකය |
| 9. | අංක 13 | ක/ඉලිප්පදෙනිය | කන්ජුක්කුලිය ප්‍රාදේශිකය |
| 10. | අංක 14 | ආරියගම | මානුවන්ගම ග්‍රාමීය බැංකුව |
| 11. | අංක 15 | බංගදෙනිය | බංගදෙනිය ප්‍රාදේශිකය |
| 12. | අංක 16 | දෙමටපිටිය | දෙමටපිටිය ප්‍රාදේශිකය |
| 13. | අංක 17, අංක 26 | කුමාරකට්ටුව, මණ්ඩලාන | කුමාරකට්ටුව ප්‍රාදේශිකය |
| 14. | අංක 20 | දිගන් වැව | බංගදෙනිය ග්‍රාමීය බැංකුව |
| 15. | අංක 21 | තිස්සෝගම | මානුවන්ගම ග්‍රාමීය බැංකුව |
| 16. | අංක 22 | එළිවිටිය | කුමාරකට්ටුව ප්‍රාදේශික වෙළඳ සැල |
| 17. | අංක 23 | ඌර් උඩයන්දළුව | ඌර්උඩයන්දළුව ප්‍රාදේශික වෙළඳ සැල |
| 18. | අංක 27 | මුගුණුවටවන | මුගුණුවටවන ග්‍රාමීය බැංකුව |

**ලේකම්**
**සී.ස. හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය.**

# සාතිශය සංවේගය!



**මහජන බැංකුවේ**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු සහාය සේවා) සහ**
**මහජන බැංකුවේ බෞද්ධ සංගමයේ ගරු අනුශාසක ලෙස කටයුතු කළ**
පිළියන්දල, මාවිත්තර, එකමුතු මාවත, 9වන පටුමග, 76/7 දරණ නිවසෙහි පදිංචිව සිටි

## ලලිත් විතාන මහතාගේ

**අභාවය පිළිබඳව අපගේ බලවත් ශෝකය මෙසේ පළකර සිටිමු.**

අවසන් කටයුතු 2022 ජූලි මස 16 වැනි සෙනසුරාදා ප.ව. 4:00ට
පිළියන්දල, මාවිත්තර, දොලේ කනත්ත සුසාන භූමියේදී සිදුකෙරේ.

මෙයට ශෝකයට පත්
මහජන බැංකු සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය,
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය.

www.peoplesbank.lk 1961 PEOPLE'S BANK CALL CENTRE PEOPLE'S BANK Pride of the Nation

# මාස 3ක් තිස්සේ ගෑස් නෑ:

# කුඩා අලෙවි නියෝජිතයෝ



# මැසිවිලි නගති

■ පොල්ගස්ඕවිට එස්. වික්‍රමආරච්චි

**කුඩා පරිමාණයේ ලිට්‍රෝ ගෑස් අලෙවි නියෝජිත ආයතන වෙත දැනට මාස තුනක කාලයක් තිස්සේ ගෑස් නොලැබීම නිසා තමන් සහ තම පාරිභෝගිකයන් බලවත් අසීරුවට පත්ව ඇතැයි ගෑස් අලෙවි නියෝජිතයෝ මැසිවිලි නගති.**

මේ පිළිබඳව අප කළ සොයා බැලීමකදී දැනගන්නට ලැබුණේ පොල්ගස්ඕවිට හන්දිය, සියඹලාගොඩ හන්දිය, ජයලියගම, ජෑම් ගස් හන්දිය, කුඩමාදූව හන්දිය, ඇල්ෆා හන්දිය සහ සල්ගස් හන්දිය යන ස්ථානවල සහ ඒ අවට කුඩා පරිමාණ අලෙවි නියෝජිත ආයතන 10කට වැඩි ප්‍රමාණයක් මේ තත්ත්වයට මුහුණපා ඇති බවයි.

මේ වන විට ගෑස් සැපයීම වැඩිවී ඇති බැවින් තමන්ටද යළි ගෑස් අලෙවියට අවස්ථාව ලබාදෙන ලෙස ඔවුහු ඉල්ලා සිටිති.

## පානදුර වෙළෙඳ සංකීර්ණය සිසුන්ගේ දුම් තිප්පොළක්

■ පානදුර සමන් කාරියවසම්

**පානදුර පෞද්ගලික බස් නැවතුම්පොළ ආසන්නයේ පිහිටා ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මාලයේ විවිධ සමාජ විරෝධී ක්‍රියා සිදුවන බවත් පාසල් හා උපකාරක පන්තිවල දරුවන් පවා මෙම ස්ථානය තුළ දුම්බීමට හුරු වී ඇති බවත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් පානදුර දකුණ පොලීසියෙන් ජනතාව ඉල්ලති.**

පානදුර ප්‍රදේශයේ ප්‍රධාන පාසල්වල ශිෂ්‍යයන් නිකරුණේ කාලය ගත කිරීමට එම ස්ථානය තෝරාගෙන ඇති බවටත් ඔවුන් විශාල පිරිසක් දුම් බීමට පුරුදු වී ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

මේ සම්බන්ධයෙන් පානදුර කොට්ඨාස භාර පොලිස් අධිකාරි සමන්ත වෙදගේ මහතාගෙන් විමසීමක් කළ අවස්ථාවේ හෙතෙම පැවසුවේ තමන් මේ පිළිබඳ දැනුවත් කොට නොමැති බවයි. කඩිනමින් මේ ගැටලුවට මැදිහත්ව කටයුතු කරන බව හෙතෙම පැවසීය.

## දිවුලපිටියට එක බසයක්වත් නෑ



■ මීරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලවආරච්චි

**උග්‍ර ඉන්ධන හිඟය හේතුකොටගෙන දිවුලපිටිය නගරයෙන් පැයකටවත් බසයක් ධාවනය නොවන තත්ත්වයක් පෙරේදා (13) මධ්‍යහ්නය වන විට දැක ගත හැකි විය.**

බස් නැවතුම් පොළ පාළුවට ගොස් තිබූ අතර දිවුලපිටිය නගරයෙන් ගමන් ආරම්භ කරන බස් රථ රැසක් දිවුලපිටිය ප්‍රදේශයේ තෙල් පෝලිම්වල නවතා තිබෙනු දැකගත හැකි විය.

දිවුලපිටිය නගරයේ ඉන්ධන පිරවුම්හල්වලට දින පහකින් ඉන්ධන ලැබී නොතිබුණි. අප කළ විමසීමේදී දැනගත හැකි වූයේ ඉන්ධන ලැබෙන බවට මෙතෙක් කිසිදු දැනුම්දීමක් ලැබී නැති බවයි.

දිවුලපිටිය සිට ගම්පහ බලා ධාවනය කෙරෙන පෞද්ගලික බස් හතරක් එකම ස්ථානයක තෙල් පෝලිමේ නවතා තිබූ අන්දම ඡායාරූපයේ දැක්වේ.

## සංචාරක හෝටල් සංගමයේ විරෝධයේදී....



■ අලුත්ගම තුසිත කුමාර ද සිල්වා

**සංචාරක හෝටල් සේවක සංගමය වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය සංවිධානය කළ විරෝධතාවක් අලුත්ගම නගරයේදී රාත්‍රී පන්දම් දල්වා පැවැත්විණි.**

විලාපය විරෝධය නමින් නම්කර තිබූ මෙම විරෝධතාවට එක් වූ පිරිස විවිධ සටන් පාඨ කියමින් ජනාධිපතිවරයාට හා අගමැතිවරයාට කඩිනමින් ඉවත් වෙන්නැයි පැවසූහ.

සමස්ත ලංකා හෝටල් සේවක සංගමය මෙය සංවිධානය කර තිබිණ. එම සංවිධානයේ සංවිධායක ජානක අධිකාරි මහතා ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

## කැලණියේ ගෑස් නැති ජනතාවට දර



■ ගම්පහ තිලකරත්න දිසානායක

**ගෑස් හිඟය හමුවේ අපහසුතාවට පත්ව සිටින ජනතාව වෙනුවෙන් ඉවුම් පිහුම් කටයුතු සඳහා කැලණියට දර ප්‍රදානයක් කිරීමට අනුරාධපුර, මහවිලච්චිය, පේමඩුව ප්‍රදේශවාසීහු පියවර ගත්හ.**

පේමඩුව රජමහා විහාරාධිපති පේමඩුවේ සුමංගල නාහිමියන්ගේ මැදිහත්වීම මත එම ප්‍රදේශවාසීන් විසින් රැස්කරන ලද දර ප්‍රමාණය කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාහේන සහ හිඹුටුවැල්ගොඩ යන ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි වැසියන් පිරිසකට බෙදදීම සිදු කළ අතර මෙම අවස්ථාවට සුමංගල නාහිමි, ගම්පහ වැඩබලන දිසාපති සුගත් කිත්සිරි මහතා සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් නදීෂානී අමරතුංග මහත්මියද එක්ව සිටියහ.

ගම්පහ වැඩ බලන දිසාපති සුගත් කිත්සිරි මහතාගේ සම්බන්ධීකරණය යටතේ මෙම කටයුත්ත සිදුකෙරිණි.

# නිවසේ තනිව සිටි උපාධිධාරිනිය පිහියකින් ඇන මරාදාලා





■ දෙල්ගොඩ - සුදත් පුබුදු කීර්ති සහ මල්වාන - ඩබ්ලිව්.ඩී.එම්. විතානගේ

**දෙල්ගොඩ කඳුබොඩ ප්‍රදේශයේ හුදෙකලාව පදිංචිව සිටි හතළිස් දෙහැවිරිදි අවිවාහක කාන්තාවක සිය නිවෙසේ නිදා සිටියදී ඉකුත්දා (12) ගෙල ප්‍රදේශයට පිහියකින් ඇන ඝාතනය කර ඇති බව මීගහවත්ත පොලීසිය කියයි.**

කඳුබොඩ ප්‍රදේශයේ නිවාස සංකීර්ණයක මෙම මරණකාරිය විසින් ඉදිකළ දෙමහල් නිවසක ඇය තනිව පදිංචිව සිට ඇති බව පොලිසිය කියයි.

ඊට ඉදිරිපිට නිවසේ පදිංචි ඇගේ සහෝදරිය විසින් අක්කාගේ නිවසේ විදුලි ලාම්පු නොදැල්වෙන බැවින් හා ඇගේ දුරකතනයෙන් පිළිතුරු නොමැති නිසා ඇය පිළිබඳව ඇගේ නිවෙසට පැමිණ සොයාබැලීමේදී නිවසේ උඩුමහලේ කාමරයේ නිදියහන මත සිය සොහොයුරිය ඝාතනය කර ඇති බව පොලීසිය දැනුවත් කළ බව පොලීසිය පවසයි.

මෙසේ ඝාතනයට ලක්ව ඇත්තේ කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක වූ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරිනියක ලෙස රැකියාව කළ කඳුබොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි ලංකා ගනේෂි පනාපිටිය (42) නමැති අවිවාහක කාන්තාවකි.

ඇගේ ඝාතනය සම්බන්ධව එම ප්‍රදේශයට පිට ප්‍රදේශයකින් පැමිණ පොල් කඩන පුද්ගලයකු පිළිබඳව පොලීසියට තොරතුරු ලැබී ඇති බවත් සැකකරු අත්අඩංගුවට ගැනීමට කඩිනමින් කටයුතු කරන බවත් මීගහවත්ත පොලීසිය කියයි.

මීගහවත්ත පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හේරත්, අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්.ඒ. විමලරත්න, පොලිස් පරීක්ෂක දිසානායක, කැලණිය ස්ථානීය අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සේනාධීර, පොලිස් පරීක්ෂක ජයලත්, (88303) ශෙහාන්, (88758) මනෝජ්, (88787) රාජපක්ෂ, (92325) ජයසිංහ, (84475)පෙරේරා යන නිලධාරීහු මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ සිදුකරති.

## ගෑස් ගන්න ගිය පානදුරේ පිරිසක් හිස් අතින් ගෙදර එති



■ පානදුර සමන් කාරියවසම්

**පානදුර නගරයට ගෑස් එන බවට පැතිර ගිය ආරංචියක් මත පානදුර මෝදරවිල ක්‍රීඩාංගණයට රැස්වූ දහසකට ආසන්න පාරිභෝගිකයෝ පෙරේදා (13) පැය පහකට අධික කාලයක් රස්තියාදුවී හිස් අතින් පිටවූහ.**

පානදුර අවට ගෑස් බෙදදීම සිදුකරන බවට ප්‍රචාරයත් සමග පාරිභෝගිකයෝ ගෑස් සිලින්ඩර රැගෙන එම ස්ථානය වෙත රැස්වූහ.

පාරිභෝගිකයන් කීවේ මුහුණු පොතේ පළවූ දැන්වීමක් අනුව තමන් පාන්දර සිට ගෑස් බලාපොරොත්තුවෙන් එම ස්ථානයේ රැස්වූ බවය.

මේ සම්බන්ධයෙන් පානදුර දකුණ පොලිසිය සඳහන් කළේ කවුරුන් හෝ වැරදි පණිවිඩයක් මුහුණු පෝතේ ලබාදීම හේතුවෙන් ජනතාව එක්රැස්වී ඇති බවය.

## දර්ගා ටවුමට දින සියයකට පසු ගෑස්



■ අලුත්ගම තුසිත කුමාර ද සිල්වා

**අලුත්ගම දර්ගානගරය ප්‍රදේශයට පෙරේදා (13) දින 100 කින් පසුව ලිට්‍රෝ ගෑස් ලොරියක් එන බවට පැතුරුණු ආරංචියත් සමග දහසකට වැඩි පිරිසක් ගෑස් ටැංකි රැගෙන අලුයම සිට පැය පහකට වැඩි කාලයක් කුඩා දරුවන් සමග විදුලි බිලත් අතැතිව පෝලිමේ සිට ගෑස් ලබා ගැනීමට උනන්දු වන අයුරු දැකගත හැකි විය.**

ගෑස් බෙදදීම දර්ගා නගරයේ අතුරු මාර්ගයක පෞද්ගලික ඉඩමක සිදුකර ඇති බව පොලිසිය කියයි.

ගෑස් ලබාගැනීමට පෝලිමේ සිටි පුද්ගලයන් අතර ඇතිවූ උණුසුම්කාරී තත්ත්වය පොලිසිය මැදිහත්ව පාලනය කර බවත් ගෑස් අලෙවි කිරීමේදී සිදුවන මුදල් ගනුදෙනුවල ආරක්ෂාව වෙනුවෙන් අලුත්ගම පොලිසිය ගිනි අවි සහිත පොලිස් නිලධාරීන් තිදෙනෙකු ආරක්ෂාවට යොදා තිබෙනු දැකගත හැකි විය.

# නිවෙසට රිංගා මහලු මවට පිහියක් පෙන්නා රන් මුදු 3ක් කොල්ල කාලා

■ ගම්පහ අධිකරණ ටෝනි කරුණානායක

**ප්‍රදේශයේ නිවසකට පැමිණ ඇති පුද්ගලයකු එම නිවසේ සිටි වයෝවෘධ මාතාවකට පිහියක් පෙන්වා මරණ බවට තර්ජනය කර ඇය පැළඳ සිටි රන් මුදු දෙකක් කොල්ලකා පලාගොස් ඇතැයි මිනුවන්ගොඩ පොලිසිය පවසයි.**

පැමිණිලිකාරිය දියණිය සහ බෑනා එම නිවසේ පදිංචිව සිටින බව පොලිසිය කීය.

පැමිණිලිකාරිය පමණක් නිවසේ සිටින අවස්ථාවේ එම නිවෙසට පැමිණ ඇති සැකකරු පැමිණිලිකාරියගෙන් බෑනා සම්බන්ධව විමසා ඇති අතර සැකකරු බෑනාගේ හිතවතකු බවට පැමිණිලිකාරියට හඟවා ඇති සැකකරු පැමිණිලිකාරිය සමග කතාබහ කරමින් සිට වතුර වීදුරුවක් ඉල්ලා ඇති බවත් සැකකරුට වතුර වීදුරුවක් ලබාදීම සඳහා පැමිණිලිකාරිය මුළුතැන් ගෙට ගිය අවස්ථාවේ සැකකරු ද පැමිණිලිකාරිය පිටුපස පැමිණ පිහියක් පෙන්වා මරණ බවට තර්ජනය කර ඇය පැළඳ සිටි රන් මුදු දෙක මංකොල්ල කා ඇති බව පොලිසිය වැඩිදුරටත් පැවසීය.

සිද්ධිය සම්බන්ධයෙන් මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කරුණු වාර්තා කර ඇති බවද පොලිසිය සඳහන් කරයි.

මිනුවන්ගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍ර. පො.ප. සාලිය පතිරාජසූරිය, උප.පො. පරීක්ෂකවරුන් වන මධුරංග විජේසූරිය, ජී.කේ. අබේරත්න, පො.සැ. සුසන්ත (55474) ඇතුළු නිලධාරීහු සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ සිදුකරති.



